**ආණමඩුව ප්‍රාදේශීය සභාව - 2020**
**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**--------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

ආණමඩුව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ආණමඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ගොඩනැගිලි පිහිටි ඉඩම් හා සභාව විසින් භුක්ති විඳින පාලනය හා නඩත්තු කෙරෙන ක්‍රීඩා පිටි, ප්‍රජා ශාලා පිහිටි භූමි හා සුසාන භූමි 16ක වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කරන බව. | පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වඩාත් උචිත වේ. |
| (ආ) | ජල සැපයුම් ව්‍යාපෘති දෙකක් සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගන්නා ලද ණය ප්‍රමාණයෙන් ඉදිරි මාස 12 ඇතුළත පියවිය යුතු රු.2,394,510 ක ණය මුදල ජංගම වගකීම් ලෙස දක්වනවා වෙනුවට ජංගම නොවන වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කරන බව. | පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වඩාත් උචිත වේ. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල සභාව විසින් මිලදී ගන්නා ලද එකතු වටිනාකම රු.149,950ක් වූ යන්ත්‍ර හා කාර්යාල උපකරණ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදි ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන බව. | ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පල්ලම සතිපොළ භූමියේ මාළු වෙළඳසැල ඉදිකිරීම හා සමගිගම පෙර පාසලේ ගෙමිදුල සැකසීම වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු එකතු වටිනාකම රු.1,323,150ක් පොදු ණයහිමි යටතේ ගිණුම්ගත කර තිබීම හේතුවෙන් පොදු ණයහිමි ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරිමේදි ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | 2020 වර්ෂයේ සභා අරමුදල් වැයකර ඉදි කරන ලද එකතු වටිනාකම රු.3,491,464ක් වූ ඉදිකිරීම්, ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරිමේදි ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව | සභාව සතු ප්‍රාග්ධන ස්වරූපයේ සියළු වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ සැපයුම්කරුවන්ට ගෙවිය යුතු එකතු වටිනාකම රු.114,770ක් ණයහිමි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරිමේදි ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව | ගිණුම් වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුවේ. |
| (ඉ) | 2020 වර්ෂයේ සභා කර්මාන්ත යටතේ ආණමඩුව සතිපොළ භූමියෙහි පුවක් බුලත් වෙළඳාම සඳහා 18x90 ප්‍රමාණයේ කුටියක් සෑදීමේ කර්මාන්තයේ අත රැඳවුම් මුදල වූ රු.50,000ක වටිනාකම තැන්පත් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරිමේදි ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.6.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ දැක්වෙන තැන්පතු හා උපලේඛන වල දැක්වෙන තැන්පතු අතර රු.737,830 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ වාර්ෂික ගිණුම් සකස් කිරීමේදි ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.22,345,631 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | උපලේඛන මේ වන විට සකස් කරමින් පවතින අතර, ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි හා අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | | | |
| මු.රෙ. 571 වගන්තිය | 2,759,380 | වසර 02ක් ඉක්මවූ ටෙන්ඩර් ඇප, විවිධ තැන්පතු හා කඩ කාමර ගිවිසුම් තැන්පතු වැනි තැන්පතු ශේෂ 213 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මු.රෙ 571 වගන්තිය ප්‍රකාරව වසර 02ක් ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,441,473ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,763,164ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම්** | | |
| හිඟ වරිපනම් ශේෂය වූ රු.9,173,337 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණු අතර, හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා බඳු ගෙවීම පැහැර හරින්නන්හට ලිඛිතව දැන්වීම මිස වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පවතින කොරෝනා වසංගතය හේතුවෙන් වරිපනම් එකතු කිරීම අඩු වී ඇති අතර ඉදිරියේ දී හිඟ ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව | වාර්ෂිකව බිල් කළ වරිපනම් වර්ෂය තුළදීම අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. |

**කුලී**

**----**

| | | |
|---|---|---|
| හිඟ කඩ කුලී හා බදු කුලී ශේෂය වූ රු.1,174,079 ක් අය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි කඩ කුලී හා බදුකුලී පවතින කොරෝනා වසංගතය නිසා අයකර ගැනීම තරමක් ප්‍රමාද වී ඇති අතර ඉදිරියේදී හිඟ ශේෂයන් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ හිටි කඩ කුලී හා බදු කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**---------------------------**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු. 4,002,614 ක් වූ උසාවි දඩ සහ රු.7,179,506 ක් වූ මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි. | රු. 4,002,614 ක් වූ උසාවි දඩ සහ රු.7,179,506 ක් වූ මුද්දර ගාස්තු ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව | සියළු දඩ මුදල් හා මුද්දර ගාස්තු හඳුනාගෙන අයකර ගත යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

**---------------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**------------------------------------**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පළ කරන ලද නිවේදනය ප්‍රකාරව ආණමඩුව ප්‍රාදේශීය සභා සීමාව තුල ත්‍රීරෝද රථ නවතා තැබීම සඳහා මසකට රු.100 බැගින් ගාස්තුවක් අය කළ යුතු බව දක්වා තිබුණද 2020 වර්ෂය සඳහා ත්‍රීරෝද රථ නැවතුම්පල 12කට අයත් ත්‍රීරෝද රථ 105 කින් රු.126,000ක මුදලක් අයවිය යුතුව තිබුණි. | මේ වන විට මෙම රථගාල් පොදු රථගාල් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම සඳහා පවතින ගැටළු නිරවුල් කරගනිමින් පවතින අතර එය කඩිනමින් ප්‍රකාශයට පත්කර සියළු රථගාල් වලින් සභාවට අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව | අදාළ ගැසට් පත්‍රය පරිදි ප්‍රාදේශීය සභා සීමාව තුල ඇති සියළු ත්‍රීරෝද රථවලින් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු විසින් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සිදුකල බවට භෞතිකව පරීක්ෂා කිරීමකින් තොරව කල නිර්දේශය මත ප්‍රධාන ලිපිකරුගේ අනුමැතියෙන් හා සභාපතිගේ සහතික කිරීමෙන් පෞද්ගලික ආයතනයක් වෙත රු.155,000ක මුදලක් 2020 ජනවාරි 28 දින ගෙවා තිබුණි. | මෙම විගණන විමසුමට අදාළ පැහැදිලි කිරීම් හා පිළිතුරු අපේක්ෂාවෙන් වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු වෙත විගණන විමසුමේ පිටපතක් 2021-04-08 දිනැති ලිපිය මඟින් යොමු කර ඇති අතර එම ලිපියට පිළිතුරු ලද වහාම ඉදිරි කටයුතු සිදු කර ඔබ වෙත වාර්තා කරන බව | ගෙවීම් කිරීමට පෙර භාණ්ඩ, වැඩ හෝ සේවා සැපයීමට අදාළව සිදුකර ඇති සියළු ක්‍රියාවලින් නිවැරදිව සිදුකර තිබේද යන්න පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව ගෙවීම් අනුමත කිරීමට කටයුතු කළ යුතුවේ. |